ශ්‍රී ලංකා මහ බැංකුව
බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**2020 මැයි 06** **නිති අසන පැන වලට පිළිතුරු** **2020 අංක 02**

---

**කොරෝනා වසංගතය (කොවිඩ්-19) නිසා බලපෑමට පත් පුද්ගලයන්, ස්වයං රැකියා සහ ව්‍යාපාර සඳහා සහන ලබාදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අංක 04,05 සහ 06 දරන චක්‍රලේඛ, 2020.03.27 දිනය දරන අති විශේෂ නියාමන ක්‍රියාමාර්ග පිළිබඳ ලිපිය සහ බලපත්‍රලාභී බැංකු විසින් රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා අයකල හැකි උපරිම පොළී අනුපාත සම්බන්ධ 2020 අංක 01 දරණ මුදල් නීති පනත් විධානය ආශ්‍රයෙන්**

# නිති අසන පැන

මෙම නිති අසන පැන සඳහා පිළිතුරු සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020.05.06 වන දින තෙක් නිකුත් කර ඇති නියාමනයන් පාදකකොට වන අතර මෙම පිළිතුරු වල වලංගුතාවය කොරෝනා වසංගතය නිසා බලපෑමට පත් පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා ලබාදෙන සහන සම්බන්ධ නියාමන සඳහා ඉදිරියේ දී හැකි යම් සංශෝධනයන් සිදුවුවහොත් ඒ අනුව වෙනස් විය හැකි බව කරුණාවෙන් සලකන්න.

1. **කොවිඩ්-19 සහන යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබන පුද්ගලයින් කවරේද?**
   - කොවිඩ්-19 වසංගතය නිසා සිය රැකියා හෝ ආදායම් අහිමිවූ ස්වයං-රැකියා නියුක්තිකයින් සහ අනෙකුත් පුද්ගලයින්
   - කොවිඩ්-19 වසංගතය නිසා තම ආදායම/ව්‍යාපාර බිඳවැටී ඇති, විදේශ විනිමයෙන් ණය ආපසු ගෙවීමට ඇති, විදේශ විනිමය උපයන්නන්

2. **කොවිඩ්-19 සහන යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබන ව්‍යාපාර/ක්ෂේත්‍ර මොනවා?**
   - සංචාරක, කොවිඩ් 19-නිසා වැඩ කටයුතු අඩාල වූ සහ විදේශයන් හි පොදු පහසුකම් හා සේවා කටයුතු වසා දැමීම් (lockdowns) නිසා අගතියට පත් ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිළි හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන් (logistic service providers) ඇතුළු අපනයන ආශ්‍රිත සෘජු හා වක්‍ර ව්‍යාපාර. මෙම සහන ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අදාළ ව්‍යාපාර/ක්ෂේත්‍රයන් වන අතර ඒ සඳහා පිරිවැටුම් සීමාවක් අදාළ නොවේ.

- රුපියල් බිලියනයට අඩු පිරිවැටුම් සහිත නිෂ්පාදන, සේවා, කෘෂිකාර්මික (සැකසුම් කර්මාන්ත ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් හා අවසරලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්. (මෙහිදී වාර්ෂික පිරිවැටුම සලකා බැලීම සඳහා දැනට පවතින ආසන්නතම ගිණුම් වාර්තා හෝ ඇස්තමේන්තු යොදා ගත හැක).
- කොවිඩ් 19-ව්‍යසනය නිසා තම ආදායම හෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට බලපෑම් එල්ලවූ, විදේශ මුදලින් ණය ගෙවීමට ඇති විදේශ විනිමය උපයන ව්‍යාපාර.

### 3. ණය සහන කාලය ලෙසින් හඳුන්වන්නේ කුමක්ද?

- ණය සහන කාලය ලෙසින් හඳුන්වන්නේ අදාළ සහන කාලය තුලදී අයවීමට නියමිත ණය ප්‍රාග්ධන සහ/හෝ පොළී ආපසු ගෙවීම් කල් දැමීම වේ.
- මෙහිදී ණය සහන කාලයක් ලබාදීම මගින් අදාළ ණය පහසුකම්වල ප්‍රාග්ධන සහ/හෝ පොළී මුළුමනින්ම කපා හැරීමක් අදහස් නොකෙරේ. ගනුදෙනුකරු විසින් ණය සහන කාලසීමාව තුල ගෙවීමට නියමිත ණය ප්‍රාග්ධන සහ/හෝ පොළී ආපසු ගෙවීම්, සහන කාලසීමාවෙන් පසුව සංශෝධිත ආපසු ගෙවීමේ සැලැස්මකට අනුව සිදු කලයුතු වේ.

### 4. මෙම සහන ලබාගත හැක්කේ කාගෙන් ද?

- ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය වනු ලබන සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් වෙතින් මෙම සහන ලබා ගත හැක.

### 5. ග්‍රාමීය බැංකු, සණස බැංකු සහ සමූපකාර බැංකු/සමිතීන් වෙතින් ලබාගත් ණය පහසුකම් සඳහා මෙම සහනයන් ලබා ගත නොහැකිද?

- මෙම සහනයන් ලබා ගත හැක්කේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය වනු ලබන සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් වෙතින් පමණි.

- ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය වනු ලබන එකම සණස බැංකුව වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (සණස සංවර්ධන බැංකුව) පමණි.

**6. මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන ණය පහසුකම් වර්ග මොනවාද?**

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති 2020 චක්‍රලේඛ අංක 04, 05 සහ 06 දී ඇති කොන්දේසි අවශ්‍යතාවයන්ට යටත් ව, සුදුසුකම් ලබන, 2020.05.15 වන දිනට පෙර ඉල්ලීමක් සිදුකර ඇති සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ රුපියල් හා විදේශ මුදලින් ලබාගත් කාලීන ණය, කල්බදු, රන් භාණ්ඩ උකස් ණය, අයිරා සහ වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා මෙම ක්‍රමය යටතේ සහන සැලසෙනු ඇත.

**7. මුදල් තැන්පතු ඇපලෙස තැබූ (cash-backed) ණය සහ නිවාස ණය මෙම සහනයන්ගෙන් ඉවත් කර ඇත්ද?**

- නැත. මෙම සහනයන් ලබාදීමේ දී ඇපයට තබා ඇති සුරැකුම් වල ස්වභාවය සැලකිල්ලට ගැනීමක් සිදු නොවන නිසා මුදල් තැන්පතු ඇපයට තබා ලබා ගත් ණය සහ නිවාස ණය පහසුකම් සඳහා ද මෙම සහනයන් ලබා ගත හැක.

**8. මෙම ණය සහනයන් ක්‍රියාත්මක වන්නේ කවදා සිටද?**

- 2020.03.25 වැනි දින හෝ ඊට පසුව අයවීමට නියමිත ණය වාරික හෝ කල්බදු වාරික සඳහා.

**9. මෙම සහන ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කල යුතුද? එසේනම්, කෙසේද?**

- ඔව්. ගනුදෙනුකරු විසින් 2020.05.15 වන දිනට පෙර විද්‍යුත් තැපැල/කෙටි පණිවුඩ/වට්ස්ඇප් ඇතුළු විද්‍යුත් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයක් ඔස්සේ, ගනුදෙනුකරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය, ණය අංකය/ගිණුම් අංකය වැනි මෙම සහනයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අවශ්‍ය අවම මූලික තොරතුරු සහිතව ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුය.

- කෙසේ නමුත්, හැකි සෑම අවස්ථාවකදීම, ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීමක් සිදු නොකල ද සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා (උදා.: පුද්ගල ණය, අයිරා, වෙළඳ ණය, රන් භාණ්ඩ උකස් ණය, ණයපත් ආදී) අදාළ සහනයන් ලබා දීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කල යුතුය.

**10. සන්නිවේදන පහසුකම් වෙත පිවිසුමක් නොමැතිකම නිසා ලිඛිත ඉල්ලීමක් සිදුකිරීමට නොහැකි ග්‍රාමීය ප්‍රදේශයක සිටින ගනුදෙනුකරුවන් හට කුමක් කල හැකි ද?**

- මූල්‍ය ආයතන විසින් හැකි සෑම විටකම ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීමක් සිදු නොකලද සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා අදාළ සහනයන් ලබා දෙනු ඇත.
- කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින් මෙම සහනයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අවශ්‍ය අවම මූලික තොරතුරු වන ගනුදෙනුකරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය, ණය අංකය/ගිණුම් අංකය වැනි විස්තර සහිතව ඉල්ලීමක් 2020.05.15 දිනට පෙර සුදුසු ආකාරයකින් ඉදිරිපත් කරන්නේ නම්, මූල්‍ය ආයතනයන් හට මෙම සහන සැපයීමේ කාර්යය කඩිනම් කිරීමට පහසුවක් වනු ඇත.
- බොහොමයක් බැංකු විසින් මෙම කාර්යය වෙනුවෙන් වෙන්කර ඇති දුරකථන අංක පිළිබඳ දැන්වීම් ඔවුන්ගේ වෙබ් අඩවි, සමාජ ජාල පිටු මෙන්ම රූපවාහිනිය ඔස්සේ ප්‍රචාරය කරන අතර එම අංක හරහා අදාළ මූල්‍ය ආයතන හා සම්බන්ධවීමෙන් මේ සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබාගත හැක.

**11. මූල්‍ය ආයතන හට කිසිදු ඉල්ලීමකින් තොරව මෙම සහන සැපයීමට නොහැක්කේ ඇයි?**

- හැකි සෑම විටකම ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීමක් සිදු නොකලද සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා අදාළ සහනයන් ලබා දීමට මූල්‍ය ආයතන විසින් කටයුතු කරනු ඇත.
- කෙසේ වෙතත්, මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන් විශාල ප්‍රමාණයකට සේවා සපයන අතර ණය අයකර ගැනීම් බොහෝවිට ස්වයංක්‍රීය පද්ධති හරහා සිදුකරනු ලබයි.

- එම නිසා, සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීම් සිදුකරන විට එකී ගනුදෙනුකරුවන් වෙන්කර හඳුනාගෙන අදාළ පද්ධතීන්හි වෙනස්කම් සිදුකර මෙම සහනයන් ලබාදෙනු ඇත.

**12. ඉල්ලීමක් කල පසු තමාට මෙම සහනයන් ලැබී ඇත්දැයි දැනගන්නේ කෙසේද?**

- ගනුදෙනුකරුවෙකු වෙතින් ඉල්ලීමක් ලැබී දින 45ක් ඇතුලත මූල්‍ය ආයතන විසින් එය සකසා අවසන් කල යුතු වේ.
- එලෙස ඉල්ලීම් සකසා අවසන් වනතෙක් එම ගනුදෙනුකරුගේ අදාළ ණය පහසුකම් ආපසු අයකරගැනීම් තාවකාලිකව අත්හිටවිය යුතුය.
- එබැවින්, මූල්‍ය ආයතන විසින් දින 45ක කාල සීමාවක් තුලදී අදාළ ඉල්ලීමේ ප්‍රතිඵලය ගනුදෙනුකරු වෙත දැනුම්දෙනු ඇත.

**13. මෙම ණය සහන ක්‍රමයේ ආරම්භක දිනය වන විට හිඟහිටි (ප්‍රමාදයව පැවති) ණය පහසුකම් සඳහා කුමක් සිදුවේ ද?**

- ණය සහනයන් ලබා දෙනු ඇත්තේ 2020.03.25 වන දින හෝ ඊට පසු අයවීමට නියමිත ණය හෝ කල්බදු වාරික සඳහා පමණි.
- කිසියම් ණය පහසුකමක් හිඟ සහිතව සක්‍රිය කාණ්ඩයේ පැවතිනි නම්, ගනුදෙනුකරු විසින් එම හිඟහිටි වාරික ණය සහන කාලසීමාවෙන් ආවරණය කරන ලෙසට අදාළ මූල්‍ය ආයතනයට ඉල්ලීමක් කල හැක. මෙහිදී ඉදිරි ණය සහන කාලසීමාව පෙර කී හිඟහිටි වාරික ප්‍රමාණයෙන් අඩුවේ.
- උදාහරණයක් ලෙස 2020 පෙබරවාරි සහ මාර්තු යන මාස දෙක තුල අයවිය යුතු වාරික හිඟ පැවැති සක්‍රිය ණය පහසුකමක් සඳහා 2020 අප්‍රේල් මස සිට මාස 6ක ණය සහන කාලයක් හිමිවන්නේ නම්, ගනුදෙනුකරු හට, එකී ණය සහන කාලසීමාවේ ආරම්භය 2020 පෙබරවාරි ලෙස පසු දාතමකොට සලකන ලෙසට මූල්‍ය ආයතනයෙන් ඉල්ලීමක් කල හැක. එවිට අදාළ ණය සහන කාල සීමාව වන මාස 6 ඇරඹේ යැයි සැලකිය යුත්තේ 2020 අප්‍රේල් සිට නොව 2020 පෙබරවාරි මස සිට වේ.

- තවද, මෙවැනි අවස්ථාවන්හිදී ගනුදෙනුකරු විසින් ඒ සම්බන්ධව අදාළ මූල්‍ය ආයතනයට ඉල්ලීමක් කොට අදාළ සංශෝධන පිළිබඳ සාකච්ඡාකරගත යුතු වේ.
- නැතහොත්, බැංකුවල ණය වාරික අඩුකරගැනීම් ස්වයංක්‍රිය බැවින්, ඕනෑම මොහොතක ගනුදෙනුකරුගේ ගිණුමට මුදල් තැන්පත් වූ වහාම, 2020.03.25 වන දින දක්වා පැවති හිඟ මුදල් අයකර ගැනීමට බැංකු විසින් ක්‍රියාකරනු ඇත.
- 2020.03.25 දින වන විට අක්‍රිය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා 2020.09.30 දක්වා ණය සහන කාලයක් හිමි වන අතර, සහන යෝජනා ක්‍රමයේ සඳහන් සුදුසුකම් ලබන ව්‍යාපාරයන්හි නියුතු ගනුදෙනුකරුවන් හට සිය ණය පහසුකම්වල දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන වාරිකයන් සහ දැනට පවතින සහ ඉදිරියේදී අයවීමට නියමිත පොළී මුදල් ප්‍රතිලේඛනගත කරන ලෙසට මූල්‍ය ආයතන වලින් ඉල්ලීමක් කල හැක. මෙලෙස ප්‍රතිලේඛනගත කල ණය පහසුකම නැවත ගෙවීම් ආරම්භ කිරීම 2020.10.01 දින හෝ ඉන් පසුව සිදුවනු ඇත.
- දැනට අක්‍රිය කාණ්ඩයේ පවතින ණය පහසුකම් සඳහා ඒවායේ මේවන විට පියවා ඇති ප්‍රමාණය මත පදනම්ව, ණය ගැනුම්කරුවා විසින් ඉදිරියේදී ගෙවීමට නියමිත සියළු ණය වාරික සහ පොළී පියවා අවසන් කරන්නේ නම්, පෙර හිඟ පැවති පොළියෙන් 25% හෝ 50% කපා හැරෙනු ඇත.

**14. දැනටමත් හිඟහිටි මුදල් පියවා නොමැතිව සහන සඳහා අයදුම් කළ හැකිද ?**

- ඔව්, දැනට හිඟහිටි මුදලක් පැවතියද සහනය සඳහා අයදුම් කල හැක.

**15. සහන සඳහා මා සුදුසුකම් ලැබුවද මූල්‍ය ආයතනය විසින් මාගේ වාරික අඩු කර ඇත්තේ ඇයි ?**

- ණය වාරික අඩු කිරීම සාමාන්‍යයෙන් ස්වයංක්‍රිය පද්ධති හරහා සිදු කෙරෙන බැවින් මූල්‍ය ආයතනය විසින් ණය වාරිකය අඩු කර තිබිය හැකිය. එබැවින්, මෙම අයකරගැනීම් ස්වයංක්‍රිය පද්ධතියෙන් ඉවත් කර එකිනෙක පුද්ගල ශ්‍රමය යොදා (manually) ආපසු බැර කිරීම සඳහා මූල්‍යායතන වෙත සාධාරණ කාල සීමාවක් ලබා දිය යුතුවේ (2020.05.15 දක්වා වත්).

- සහන ලබා දී ඇති ණය පහසුකම් වලින් දැනටමත් වාරික අඩු කර තිබේ නම් එම මුදල් නැවත ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වලට බැර කරනු ලැබේ.

**16. සුදුසුකම් නොලත් ණය ගැනුම්කරුවන් හට දින 60ක් දක්වා සහනයක් ලබා දී තිබිය දීත් මුල්‍ය ආයතනය විසින් මගේ ණය වාරිකය අඩු කරගෙන ඇත්තේ ඇයි ?**

- ණය වාරික අඩු කිරීම සාමාන්‍යයෙන් ස්වයංක්‍රිය පද්ධති හරහා සිදු කෙරෙන බැවින් මුල්‍ය ආයතනය විසින් ණය වාරිකය අඩු කර තිබිය හැකිය. එබැවින්, මෙම අයකරගැනීම් එකිනෙක වෙන්කර හඳුනාගෙන පුද්ගල ශ්‍රමය යොදවා ආපසු හැරවීම සඳහා මුල්‍යායතන වෙත සාධාරණ කාල සීමාවක් ලබා දිය යුතුවේ (2020.05.15 දක්වා වත් ).
- මෙම යෝජනා ක්‍රමය යටතේ වෙනත් සහන සඳහා හිමිකම් නොලබන ණය ගැනුම්කරුවන් සඳහා වුවද 2020.04.01 දින සිට ආරම්භ වන දින 60 ක කාලයක් තුළ ගෙවිය යුතු ණය සහ අත්තිකාරම් පියවීම සඳහා අමතර දින 60 ක කාලයක් ලබා දී ඇති බැවින් එම කාලසීමාව තුළ අයකරගත් ණය වාරිකයන් නැවත ගෙවීමට කටයුතු කරනු ලැබේ.

**17. මාගේ ණය පහසුකම් මා විසින් නැවත නොගෙවීම නිසා අක්‍රියව පවතී නම්, මා මෙම සහනය සඳහා සුදුසුකම් නොලබන්නේද?**

- ඔබ විසින් ලබා ගන්න ලද ණය පහසුකම් නැවත නොගෙවීම නිසා අක්‍රියව පැවතිය ද ඔබ සුදුසුකම් ලත් කාණ්ඩයකට අයත් වේ නම් ඔබට එම සහන ලබාගත හැකිය.
- පහත දැක්වෙන සහන ලබාදෙනුයේ ඒ සඳහා සුදුසුකම් ලබන ව්‍යාපාර වෙත පමණි. එනම්; සංචාරක කර්මාන්තය මෙන්ම, ඇඟලුම් , තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි සඳහා වන ඍජු හා වක්‍ර අපනයන ආශ්‍රිත ව්‍යාපාරයන් සහ COVID -19 හේතුවෙන් වෙනත් රටවල් වසා දමනු ලැබීම නිසා අගතියට පත්, ඒ ආශ්‍රිත සහසම්බන්ධිත සේවාවන් (Logistics) සපයන්නන් මෙන්ම නිෂ්පාදන, සේවා, කෘෂිකර්මාන්තය (සැකසීම් ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම් සහ බලයලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් සහ වෙළඳ ව්‍යාපාර වැනි අංශ වල නියැලී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් වෙත.
    - 2020.03.25 දින දක්වා අය කරනු ලබන දඩ පොළී අදාළ මුල්‍ය ආයතනය විසින් කපාහරිනු ඇත.

- 2020.09.30 දක්වා ණය ගෙවීම් තාවකාලිකව අත්හිටුවීමේ සහන කාලයක් ලබා දෙනු ඇත.
- පැහැරහරින ලද වාරික වල ඉතිරි වී ඇති ප්‍රාග්ධනය හා ඉතිරි පොළිය, මෙන්ම ඉදිරියේදී ගෙවීමට ඉතිරිව ඇති පොළී ද වසර තුනක කාලයක් දක්වා ප්‍රතිව්‍යුහගත කරනු ඇත. කෙසේ වුවද මුල් කල්පිරීමේ කාලය වසර තුනකට වඩා වැඩිනම්, තවත් ඒ හා සමාන කාල සීමාවකින් කල්පිරෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමට මූල්‍ය ආයතනයට හැකියාව ඇත.
- ඒ අනුව දැනට අක්‍රීයව පවතින ණය පහසුකම් සඳහා ගෙවීම් ණය සහන කාලයක් ලබා දෙන ලෙස ඔබ විසින් මූල්‍ය ආයතනයෙන් ඉල්ලා සිටියහොත් මූල්‍ය ආයතනය විසින් 2020.09.30 දක්වා තාවකාලිකව ගෙවීම් අත්හිටුවීමේ සහනයක් ඔබවෙත ලබාදී අදාළ ණය මුදල තවත් වසර තුනක් හෝ මුල් කාල පරිච්ඡේදය වසර තුන ඉක්මවන අවස්ථාවන්හීදී ඊට අනුරූප වන කාල සීමාවකට දීර්ඝ කර 2020.10.01 දින සිට ආපසු අය කරගැනීම ඇරඹෙන පරිදි ප්‍රතිව්‍යුහගත කෙරෙනු ඇත.
- තවද, මෙම නැවත සකස් කරන ලද ණය මුදල මෙම වසර තුන තුල හෝ එකඟවූ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ සම්පූර්ණයෙන් ගෙවන්නේ නම්, 2020.09.30 දක්වා කල් දැමූ පොළී වාරික සඳහා නිදහස් කිරීමක් ඔබට ලබා ගැනීමට හැකි වනු ඇත.
- මේ වන විට අක්‍රිය කාණ්ඩයේ පවතින ණයවල දැනට ගෙවා ඇති ප්‍රමාණය අනුව, ණය ගැනුම්කරුවා විසින් ඉදිරියේදී ගෙවීමට ඇති පොළී හා ණය වාරිකයන් සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන්නේ නම්, හිඟහිටි ණය පොළියෙන් 25% හෝ 50%ක් කපා හරිනු ඇත.

**18. මූල්‍ය ආයතන විසින් මාගෙන් මේ වන විටත් අයකරගෙන ඇති වාරික නැවත ගෙවනු ඇතිද? එසේනම්, කුමන කොන්දේසි යටතේ, කවදාද ?**

- ඔව්. සහන ලබාදී ඇති ණය පහසුකම් වලින් දැනටමත් වාරික අඩු කර ඇත්නම්, ඒවා නැවත ගනුදෙනුකරුගේ ගිණුමට බැර කෙරෙනු ඇත.
- මෙම යෝජනා ක්‍රමය යටතේ වෙනත් සහන නොලබන ණය ගැනුම් කරුවන් සඳහා වුවද 2020.04.01 දින සිට ඇරඹෙන පරිදි දින 60 ක කාලයක් තුළ පියවිය යුතු ණය සහ අත්තිකාරම්

සඳහා අමතර දින 60 ක කාලයක් ලබා දී ඇති බැවින්, එම කාල සීමාවට අදාළව යම් අය කරගැනීමක් සිදුව ඇත් නම් ඒවා ආපසු ගෙවනු ඇත.

- සාමාන්‍යයෙන් ණය වාරික අඩු කිරීම ස්වයංක්‍රිය පද්ධති හරහා සිදු කෙරෙන බැවින් මූල්‍ය ආයතන මගින් ණය වාරිකය දැනටමත් අඩු කර තිබිය හැක. එබැවින්, මෙම අයකරගැනීම් එකිනෙක වෙන්කර හඳුනාගෙන පුද්ගල ශ්‍රමය යොදවා ආපසු හැරවීම සඳහා මූල්‍යායතන වෙත සාධාරණ කාල සීමාවක් ලබා දිය යුතුවේ (2020.05.15 දක්වා වත්).

**19. අප සුදුසුකම් ලත් පුද්ගලයකු හෝ ව්‍යාපාරයක් නොවන අතර මූල්‍ය ආයතන මගින් ලබා ගත ණය ආපසු ගෙවීමට අපට ආදායම් මාර්ගයක් ද නොමැතිනම් කුමක් කල යුතු ද?**

- චක්‍රලේඛ වලට ඇතුලත් කර ඇති කිසිඳු සහනයක් සඳහා හිමිකම් නොලබන සියලුම ණය ගැනුම්කරුවන් හට 2020.04.01 දින සිට ඇරඹෙන දින 60 ක කාලය තුළ පියවිය යුතු ණය සහ අත්තිකාරම් පියවීම සඳහා අමතර දින 60 ක කාලයක් ලබා ගත හැකිය.

**20. සහන කාලසීමාවට අදාළ පොළී සංරචකය සඳහා කුමක් සිදුවේද?**

- ණය සහන කාලය අවසන් වන තුරු ණය වාරික (ප්‍රාග්ධන+පොළී) ගෙවීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, තාවකාලික සහන කාල සීමාව අවසන් වූ විට, සහන ලබා දීමට පෙර ගනුදෙනුකරුවන් එකඟ වූ පරිදි ගෙවීම් ආරම්භ කළ යුතුය. කල් තබන ලද ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරික සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පාරිභෝගිකයාගෙන් අමතර පොළියක් අය නොකරනු ඇත.

**21. ණය සහන කාල සීමාව සඳහා අදාළ වන ප්‍රාග්ධනය සහ පොළී වාරික බැංකු විසින් අනාගතයේදී ගනුදෙනුකරුවන්ගෙන් අයකර ගන්නේද? එසේ නම් කෙසේද?**

- ඔව්. චක්‍රලේඛයන්ට අනුව, අදාළ ණය සහන කාලසීමාව මගින් පාරිභෝගිකයින්ට ලබා දෙන්නේ ප්‍රාග්ධනය සහ පොළිය ආපසු ගෙවීම කල්දැමීමේ හැකියාව පමණි. එනිසා, ණය සහන කාලසීමාව හේතුවෙන් බලපත්‍රලාභී බැංකු හට තමන් විසින් අයකරගන්නා ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරික කපා දැමීම අවශ්‍ය නොවේ. උදාහරණයක් ලෙස, සහනය පහත පරිදි ක්‍රියාත්මක වේ:

**නිදසුන**

ණය ලබා දුන් දිනය 2019.04.01

ණය මුදල රුපියල් 2,000,000

ණය කාලසීමාව (මූලික) මාස 24

පොළී අනුපාතය 16%

මාසික වාරිකයේ වටිනාකම (ව්‍යුත්පන්නිත) රුපියල් 97,926

2020 මාර්තු මස අවසන් වන විට ඉතිරි ව ඇති මාසික වාරික ගණන 12

- 2020 අප්‍රේල් මස සිට මාස 6ක ණය සහන කාලයක් සඳහා ගනුදෙනුකරු සුදුසුකම් ලබයි නම්, ගනුදෙනුකරු විසින් බැංකුව වෙත 2020 අප්‍රේල් සිට 2020 සැප්තැම්බර් මස දක්වා මාසික වාරික ගෙවීමට අවශ්‍ය නොවේ.
- නමුත්, ගනුදෙනුකරු විසින් 2020 ඔක්තෝබර් මස සිට මුලින් ගිවිසගත් පරිදි 2021 මාර්තු 21 දක්වා සහ ඊට අමතරව, 2021 සැප්තැම්බර් මස දක්වා තවත් මාස 06ක කාලයකට රුපියල් 97,926 බැගින් මාසික ණය වාරික ගෙවිය යුතුය.
- සැකවින් කියතොත්, මූලික ණය කාල සීමාව ණය සහන කාල සීමාවට සමාන කාලයකින් දීර්ඝ වන අතර මාසික ණය වාරිකයේ වටිනාකම පෙර වාරිකයන් ගේ මට්ටමින් නොවෙනස්ව පවතී.

**22. මගේ චෙක්පත් ගෙවීම් නැවැත්වීමට අවශ්‍ය නම්, මම එය කරන්නේ කෙසේද? ඒ සඳහා ගාස්තුවක් අයවේ ද?**

- ඔබ විසින් ලියන ලද චෙක්පත් සඳහා ගෙවීම් නැවැත්වීම සඳහා ඔබේ බලපත්‍රලත් බැංකුවෙන් ඉල්ලීමක් කල හැක. 2020.09.30 දක්වා කාල සීමාව තුළ ගෙවීම් නැවතුම් සඳහා ගාස්තු අය නොකරන ලෙස සියලුම මූල්‍ය ආයතනවලට දැනුම් දී ඇත.

**23. සහන සඳහා මා සුදුසුකම් ලැබුවත් නැතත් ණය පහසුකම් සඳහා දඩ මුදල් හෝ ප්‍රමාද ගෙවීම් ගාස්තු අය කරනු ලැබේද?**

- 20.209.09.30 දක්වා කාල සීමාව තුළ චෙක්පත් අගරුවීම්, ගෙවීම් නැවැත්වීම, සියලුම ණය කාඩ්පත් සඳහා ගෙවීම් ප්‍රමාදවීමේ ගාස්තු සහ වෙනත් ණය පහසුකම් සඳහා ගාස්තු අය නොකරන ලෙස සියලුම මූල්‍ය ආයතනවලට දැනුම් දී ඇත.
- ලබා දෙන ලද සහන යටතේ කල්දමා ඇති ප්‍රාග්ධනය සහ/හෝ පොළී වාරික සඳහා අමතර පොලියක් අය නොකෙරේ.

**24. මෙම චක්‍රලේඛයේ සඳහනක් නොමැති, හුදෙක්ම ව්‍යාපාරික ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකරන කල්බදු පහසුකම් යටතේ ලබාගත් වාහන සඳහා කුමක් සිදුවේද?**

- ස්වයං-රැකියා නියුත්තිකයන් හට සහ සියළුම ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ සහ ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගන්නා අනෙකුත් වත්කම් වන යතුරුපැදි හා කුලී රථ (පුද්ගලික භාවිතය සඳහා නොවේ) හිමිකරුවන් හට සිය කල්බදු වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් ලබා දෙනු ඇත.
- එමෙන්ම, ඉහත වර්ගීකරණයට අයත් නොවන සහ පුද්ගලික භාවිතය සඳහා වන කල් බදු පහසුකම යටතේ ලබාගෙන ඇති වාහන සඳහා, 2020.04.01 දින සිට ඇරඹෙන දින 60 ක කාලය තුළ පියවීම සඳහා ගෙවිය යුතු ණය සහ අත්තිකාරම් පියවීමට අමතර දින 60 ක කාලයක් ලබා ගත හැකිය. චක්‍රලේඛවල ඇතුළත් කර ඇති වෙනත් කිසිදු සහනයක් සඳහා හිමිකම් නොලබන අනෙකුත් සියලුම ණය ගැනුම්කරුවන් හට මෙම සහනය හිමි වනු ඇත.

**25. මා හට ව්‍යාපාරයක් ඇති නමුත් මගේ පිරිවැටුම රුපියල් බිලියන 1.2 කි, මට ලබාගත හැකි සහනයන් මොනවාද?**

- මෙය ඔබේ ව්‍යාපාරය අයත් අංශය මත රඳා පවතී.
- කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් විදේශයන් හි වැඩ කටයුතු නතර වීම් නිසා තම වැඩ කටයුතු අත්හිටුවීමට ලක් වූ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපාර/ක්ෂේත්‍ර, සෘජු හා වක්‍ර අපනයන ආශ්‍රිත ව්‍යාපාරවලට ඇතුලත් ඇඟලුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි සහ ඒ සම්බන්ධිත කාර්යය සම්පාදන සේවා සපයන්නන් සඳහා සහන ලබා ගැනීමට පිරිවැටුම් සීමාවක් නොපවතී.

- ඔබේ ව්‍යාපාරය මෙම කිසිදු අංශයකට අයත් නොවන්නේ නම් සහ චක්‍රලේඛවල ඇතුළත් කර ඇති ණය සහන සඳහා සුදුසුකම් නොලැබුනත් 2020.04.01 දින සිට ඇරඹෙන දින 60 ක කාලය තුළ ගෙවිය යුතු ණය සහ අත්තිකාරම් පියවා ගැනීම සඳහා දින 60 ක අමතර කාලයක් ලබා ගත හැකිය.

**26. මා සතුව මසකට රුපියල් මිලියන 2ක පිරිවැටුමක් සහිත රෙදිපිළි ව්‍යාපාරයක් ඇත, නමුත් මේ බව පෙන්වීමට මට සකස් කරගත් ගිණුම් නොමැත. කෙසේ වෙතත්, මම XX නැමැති බැංකුව සමඟ ජංගම ගිණුමක් පවත්වාගෙන යමි. මගේ සාප්පුවේ තොග ඇති අතර දැනට පවතින තත්ත්වය යටතේ මගේ ව්‍යාපාරය දින නියමයක් නොමැතිව වසා දමනු ඇති අතර මගේ බිරිඳට සහ දරුවන්ට වෙනත් ජීවන මාර්ගයක් ද නොමැත. මෙම සහන යෝජනා ක්‍රමයෙන් මට ලබා ගත හැකි සහන මොනවාද?**

- මෙම යෝජනා ක්‍රමය යටතේ ඇඟලුම් අංශයේ බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා මාස හයක ණය සහන කාලයක්, පිරිවැටුම නොසලකා සපයනු ලබන අතර එය ඔබේ ව්‍යාපාරයේ නමට ලබාගත් ණය සඳහා ද අදාළ වේ.
- එමෙන්ම, ස්වයං-රැකියා නියුක්තිකයන් සහ සියළුම ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන වෑන් රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ, බස් රථ සහ ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගන්නා අනෙකුත් වත්කම් වන යතුරුපැදි හා කුලී රථ හිමිකරුවන් හට පමණක් සිය කල්බදු වාරික ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් ලබා දෙනු ඇත.
- 2020.09.30 දින දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සියලුම අයිරා, වෙළඳ මූල්‍ය ණය පහසුකම් සහ රන් භාණ්ඩ උකස් ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කර ඇත.
- තවද, සුදුසුකම් ලබන පුද්ගලයන්ගේ රුපියල් මිලියනයක් හෝ ඊට අඩු සියළුම පුද්ගලික ණය සහ කල්බදු පහසුකම් සඳහා මාස තුනක ණය සහන කාලයක් ලබා දී ඇති අතර, මෙයට නිවාස ණය, පරිභෝජන ණය, මුදල් යටතේ ලබා දුන් ණය, කල්බදු ණය පහසුකම් වැනි සියලුම ණය පහසුකම් ඇතුළත් වේ.

- ඔබ ලබා ගත් ණය පහසුකම් චක්‍රලේඛවල ඇතුළත් කර ඇති මෙම සහන යෝජනා ක්‍රමය කිසිවක් සඳහා සුදුසුකම් නොලැබුනත්, 2020.04.01 දින සිට ඇරඹෙන දින 60 ක කාලය තුළ ගෙවිය යුතු ණය සහ අත්තිකාරම් පියවා ගැනීම සඳහා දින 60 ක අමතර කාලයක් ලබා ගත හැකිය.
- මීට අමතරව, 2020 මාර්තු සහ අප්‍රේල් මාසවල කල් ඉකුත්වීමට නියමිත රුපියල්. 500,000 ට අඩු වටිනාකමින් යුතු චෙක්පත් වල වලංගු කාලය, 2020.05.15 දක්වා දීර්ඝ කර ඇත.
- තවද, 2020.09.30 දින දක්වා කාල සීමාව තුළ අගරු චෙක්පත් ගාස්තු, චෙක්පත් ගෙවීම් නැවැත්වීමේ ගාස්තු, සියලුම ණය කාඩ්පත් සඳහා ප්‍රමාද ගෙවීම් ගාස්තු සහ වෙනත් ණය පහසුකම් සඳහා ගාස්තු අය නොකරන ලෙස සියලුම මූල්‍ය ආයතනවලට දැනුම් දී ඇත. ලබා දී ඇති සහන යෝජනා ක්‍රමය යටතේ කල් දැමූ ප්‍රාග්ධනය සහ/ හෝ පොළී වාරික සඳහා අමතර පොළියක් අය නොකෙරේ.

**27. මා විසින් කතුන් 6 දෙනෙකු ගේ සේවය ලබා ගනිමින් තෝරාගත් ඇඟලුම් නිපදවන කුඩා ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර අලෙවිසැලක් ද පවත්වාගෙන යමි. අලෙවිසැල සඳහා සේවකයින් 3 දෙනෙකු, වාහනයක් සහ රියදුරෙකු උපයෝගී කර ගනිමි. මට තවමත් ඔවුන්ගේ වැටුප්, වෙළඳසැල සහ සේවා ස්ථානය සඳහා කුලිය සහ මසකට රුපියල් 225,000 ක් වන වාහනය සඳහා කල් බදු වාරිකය ගෙවිය යුතුය. මා විසින් මාසිකව ගෙවිය යුතු ප්‍රාග්ධනය සහ පොළිය ඇතුලත් රුපියල් මිලියන 10 ක බැංකු ණයක් ලබාගෙන ඇත. මෙම සහන යෝජනා ක්‍රමයෙන් මට ලබා ගත හැකි සහන මොනවාද?**

- පිරිවැටුම නොසලකා ඇඟලුම් අංශයේ බලපෑමට ලක්වූ ව්‍යාපාර සඳහා මාස හයක ණය සහන කාලයක් මෙම යෝජනා ක්‍රමය මඟින් සපයනු ලබන අතර එය ඔබේ ව්‍යාපාරයේ නාමයෙන් ලබාගත් ණය සඳහා අදාළ වේ.
- එමෙන්ම, කල්බදු ණය වාරික සඳහා මාස හයක ණය සහන කාලයක් ස්වයං රැකියාවල නියුතු පුද්ගලයින්ට සහ සියළුම ත්‍රිරෝද රථ, පාසල් ප්‍රවාහන රථ, ලොරි රථ, භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගන්නා කුඩා රථ, බස් රථ සහ ව්‍යාපාර කටයුතු සඳහා

යොදාගන්නා අනෙකුත් වත්කම් වන යතුරු පැදි සහ කුලී රථ හිමිකරුවන්ට පමණක් හිමිවේ.

- 2020.09.30 දින දක්වා කාලසීමාව තුල පියවීමට නියමිත හෝ කල්පිරීම සිදුවන හෝ නැවත සමාලෝචනය සඳහා සලකා බැලෙන සියලුම අයිරා, වෙළඳ මූල්‍ය ණය පහසුකම් සහ රන් භාණ්ඩ උකස් ණය පහසුකම් 2020.09.30 දක්වා දීර්ඝ කර ඇත.
- තවද, සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ රුපියල්. මිලියනයක් හෝ ඊට අඩු සියළුම පුද්ගලික ණය සහ කල්බදු පහසුකම් සඳහා මාස තුනක ණය සහන කාලයක් ලබා දී ඇති අතර, මෙයට නිවාස ණය, පරිභෝජන ණය, මුදල් යටතේ ලබා දුන් ණය, කල්බදු ණය පහසුකම් වැනි සියලුම ණය පහසුකම් ඇතුළත් වේ.
- ඔබ ලබා ගත් ණය පහසුකම් චක්‍රලේඛවල ඇතුළත් කර ඇති මෙම සහන යෝජනා ක්‍රමය කිසිවක් සඳහා සුදුසුකම් නොලැබුනත්, 2020.04.01 දින සිට ඇරඹෙන දින 60 ක කාලය තුළ ගෙවිය යුතු ණය සහ අත්තිකාරම් පියවා ගැනීම සඳහා දින 60 ක අමතර කාලයක් ලබා ගත හැකිය.
- මීට අමතරව, 2020 මාර්තු සහ අප්‍රේල් මාසවල කල් ඉකුත්වීමට නියමිත රුපියල් 500,000 ට අඩු වටිනාකමින් යුතු චෙක්පත් වල වලංගු කාලය, 2020.05.15 දක්වා දීර්ඝ කර ඇත.
- තවද, 2020.09.30 දින දක්වා කාල සීමාව තුළ අගරු චෙක්පත් ගාස්තු, චෙක්පත් ගෙවීම් නැවැත්වීමේ ගාස්තු, සියලුම ණය කාඩ්පත් සඳහා ප්‍රමාද ගෙවීම් ගාස්තු සහ වෙනත් ණය පහසුකම් සඳහා ගාස්තු අය නොකරන ලෙස සියලුම මූල්‍ය ආයතනවලට දැනුම් දී ඇත. ලබා දී ඇති සහන යෝජනා ක්‍රමය යටතේ කල් දැමූ ප්‍රාග්ධනය සහ/ හෝ පොළී වාරික සඳහා අමතර පොළියක් ද අය නොකෙරේ.

## 28. අයිරා පහසුකම් සඳහා ලබා ගත හැකි සහන මොනවාද?

- 30.09.2020 දක්වා වන කාලය තුල ගෙවිය යුතු, පරිණත වන හෝ සමාලෝචනය කරනු ලබන ස්ථිර අයිරා පහසුකම් සඳහා වන පියවීමේ කාලය 30.09.2020 දින දක්වා දීර්ඝ කර ඇත.
- කෙසේ වෙතත්, 2020.03.25 දිනට වන තාවකාලික අයිරා පහසුකම් සම්බන්ධයෙන්, සුදුසුකම් ලත් ණය ගැතියන් සඳහා කල් ඉකුත්වීම මාස දෙකකින් දීර්ඝ කරනු ලැබේ.

- දීර්ඝ කරන ලද කාල සීමාව තුළ එවැනි පහසුකම් සඳහා පොළී අනුපාතය සියයට 13 ක උපරිමයකට සීමා කෙරේ.
- ණය සහන කාල සීමාව තුළ ණය ගැනුම්කරුවන් අදාළ පොළිය ගෙවීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, අයිරා සඳහා පොළිය ගෙවීමට කැමති ඕනෑම ණය ගැතියෙකුට එසේ කළ හැකිය.

**29. වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා ලබා ගත හැකි සහන මොනවාද?**

- 30.09.2020 දක්වා වන කාලය තුල ගෙවිය යුතු, පරිණත වන හෝ සමාලෝචනය කරනු ලබන වෙළඳ මූල්‍ය පහසුකම් සඳහා වන පියවීමේ කාලය 30.09.2020 දින දක්වා දීර්ඝ කර ඇත.
- මේ සඳහා ඖෂධ, වෛද්‍ය උපකරණ, ආහාර, පොහොර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා ලබා දී ඇති පහසුකම් සහ සංචාරක, ඇඟලුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වගා වැනි සෘජු හා වක්‍ර අපනයන ආශ්‍රිත ව්‍යාපාර සහ කොවිඩ්-19 හේතුවෙන් අහිතකර ලෙස බලපා ඇති ඒ ආශ්‍රිත සැපයුම්කරුවන් සඳහා ලබා දී ඇති අපනයන පහසුකම් ඇතුළත් වේ.

**30. රන් භාණ්ඩ උකස් ණය පහසුකම් සඳහා ඇති සහන මොනවාද?**

- 30.09.2020 දක්වා වන කාලය තුල ගෙවිය යුතු හෝ කල්පිරෙන රන් භාණ්ඩ උකස් ණය පහසුකම් සඳහා වන පියවීමේ කාලය 30.09.2020 දින දක්වා දීර්ඝ කර ඇත.
- 2020.04. වැනි දින සිට අළුතින් ලබා දෙන උකස් අත්තිකාරම් 27සහ එ දින සිට නැවත අළුත් කිරීමට යෙදෙන දැනට පවතින උකස් අත්තිකාරම් සඳහා, බලපත්‍රලාභී බැංකු මගින් පුද්ගලික ස්වර්ණාභරන සුරැකුම් ලෙස තබා ගනිමින් මුදල් ණයට දීමේදී අය කල හැකි උපරිම පොළී අනුපාතය වසරකට 12% හෝ වසරකට අඩු කාලයක් සඳහා මසකට 1% ක උපරිමයකට යටත් වේ.

**31. මෙම සහන සඳහා සුදුසුකම් ලබන්නේ පුද්ගලික ණය පමණක්ද?**

- නැත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 4 සහ 5 චක්‍රලේඛ වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට යටත්ව රුපියල් සහ විදේශ මුදල් වලින් ලබාගෙන ඇති කාලීන ණය,

කල්බදු පහසුකම්, රන් භාණ්ඩ උකස් ණය, අයිරා සහ වෙළඳ මූල්‍ය පහසුකම් සුදුසුකම් ලත් ණය පහසුකම් වේ.

**32. නිවාස ණය ලබා ගත් ගනුදෙනුකරුවන් සඳහා ලබා ගත හැකි සහන මොනවාද?**

- රුපියල් මිලියනයක් හෝ ඊට අඩු වටිනාකමක් සඳහා ලබා ගත් ණය පහසුකම් සඳහා මාස තුනක ණය සහන කාලයක් හිමිවේ.
- රුපියල් මිලියන 1 කට වැඩි වටිනාකමක් ඇති නිවාස ණය පහසුකම් සඳහා චක්‍රලේඛවල ඇතුළත් කර ඇති කිසිදු සහනයක් සඳහා හිමිකමක් නොමැති අතර, එවැනි ගනුදෙනුකරුවකුට 2016.04.01 දින සිට දින 60 ක් ඇතුළත ගෙවිය යුතු ණය පියවා ගැනීම සඳහා 2016.04.01 සිට අදාළ වන පරිදි අමතර දින 60 ක කාලයක් ලබාගත හැකිය.

**33. මට නිවාස ණය වාරික කීයක් ඉතිරි කර ගත හැකිද?**

- රුපියල් මිලියනයක් හෝ ඊට අඩු වටිනාකමක් සඳහා ලබා ගත් ණය පහසුකම් සඳහා මාස තුනක ණය සහන කාලයක් හිමිවේ.
- රුපියල් මිලියන 1 කට වැඩි වටිනාකමක් ඇති නිවාස ණය පහසුකම් සඳහා චක්‍රලේඛවල ඇතුළත් කර ඇති කිසිදු සහනයක් සඳහා හිමිකමක් නොමැති අතර, එවැනි ගනුදෙනුකරුවකුට 2016.04.01 දින සිට දින 60 ක් ඇතුළත ගෙවිය යුතු ණය පියවා ගැනීම සඳහා 2016.04.01 සිට අදාළ වන පරිදි අමතර දින 60 ක කාලයක් ලබාගත හැකිය.
- එබැවින්, තාවකාලික ණය සහන කාල සීමාව තුළ ඔබට ඔබේ නිවාස ණය වාරික ගෙවීම නතර කළ හැකි නමුත් තාවකාලික ණය සහන කාල සීමාව අවසන් වීමෙන් පසු එම ණය වාරික ඔබට නැවත ගෙවීමට සිදුවේ.

**34. පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින්ට ලබා දෙන සහන මොනවාද?**

- සියළුම පෞද්ගලික අංශයේ විධායක නොවන සේවකයින්ට ලබා දී ඇති පුද්ගලික ණය සඳහා 2016.05.30 වන තෙක් ණය සහන කාලයක් ලබා දී ඇති අතර මෙම පුද්ගලික ණයවල වටිනාකමට සීමාවක් නොමැත.

- කෙසේ වෙතත්, ණය ගැනුම්කරු සේවය කරන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ඔහු/ඇයගේ ධූරාවලි තනතුර මත පදනම්ව හෝ සේවා යෝජකයාගෙන් තහවුරු කිරීමක් ලබා ගැනීමෙන් ණය ගැනුම්කරු විධායක නොවන සේවකයෙකු ද යන්න මූල්‍ය ආයතන විසින් තීරණය කරනු ඇත.

**35. රාජ්‍ය අංශයේ සේවකයින්ට ලබා දෙන සහන මොනවාද?**

- රුපියල් මිලියනයට අඩු මුළු ණය වටිනාකමකින් යුතු සියලුම පුද්ගලික ණය සහ කල්බදු වාරික සඳහා මාස 03ක ණය සහන කාල සීමාවක් ලබාදී ඇත.
- මේ සඳහා රාජ්‍ය අංශයේ සේවකයන් විසින් ලබාගෙන ඇති මුළු ණය මුදල රුපියල් මිලියනයක් හෝ ඊට අඩු සියලුම නිවාස ණය, පරිභෝජන ණය, තැන්පතු ඇප තැබූ ණය, කල්බදු පහසුකම් ද අයත් වේ.
- මෙම චක්‍රලේඛවල ඇතුලත් කර ඇති වෙනත් කිසිදු සහනයක් නොලබන රාජ්‍ය අංශයේ සේවකයින් විසින් ලබා ලත් ණය පහසුකම් සඳහා, 2020.04.01 දින සිට ඇරඹෙන වන දින 60ක කාලය තුලදී පියවීමට ඇති ණය සහ අත්තිකාරම් පියවා දැමීම සඳහා තවත් අමතර දින 60ක කාලයක් පමණක් හිමි වේ.

**36. විශ්‍රාමිකයින්ට ලබා දෙන සහන මොනවාද?**

- රුපියල් මිලියනයට අඩු මුළු ණය වටිනාකමකින් යුතු සියලුම පුද්ගලික ණය සහ කල්බදු වාරික සඳහා මාස 03ක ණය සහන කාල සීමාවක් ලබාදී ඇත.
- මේ සඳහා විශ්‍රාමිකයන් විසින් ලබාගෙන ඇති මුළු ණය මුදල රුපියල් මිලියනයක් හෝ ඊට අඩු සියලුම නිවාස ණය, පරිභෝජන ණය, තැන්පතු ඇප තැබූ ණය, කල්බදු පහසුකම් ද අයත් වේ.
- මෙම චක්‍රලේඛවල ඇතුලත් කර ඇති වෙනත් කිසිදු සහනයක් නොලබන විශ්‍රාමිකයන් විසින් ලබා ලත් ණය පහසුකම් සඳහා, 2020.04.01 දින සිට ඇරඹෙන වන දින 60ක කාලය

තුලදී පියවීමට ඇති ණය සහ අත්තිකාරම් පියවා දැමීම සඳහා තවත් අමතර දින 60ක කාලයක් පමණක් හිමි වේ.

**37. රුපියල් මිලියනයට වඩා ණය පහසුකම් ලබාගෙන ඇති විශ්‍රාමිකයන් සහ හෝ රාජ්‍ය අංශයේ සේවකයින් මෙම ණය සහනය ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි ද?**

- ඔව්. 2020.04.01 දින සිට ඇරඹෙන වන දින 60ක කාලය තුලදී පියවීමට ඇති ණය සහ අත්තිකාරම් පියවා දැමීම සඳහා තවත් අමතර දින 60ක කාල සීමාවක් ලබා දී ඇත.

**38. කාරක ප්‍රාග්ධන ණය සහ/හෝ ආයෝජන අරමුණු සඳහා ණය ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා සහ එවැනි ණයවල ලක්ෂණ මොනවාද?**

- ණය ගැනුම්කරු විසින් පිළිගත හැකි ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන්නේ නම්, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව කාරක ප්‍රාග්ධන හෝ ආයෝජන අරමුණු සඳහා මූල්‍ය ආයතන විසින් අතිරේක ණයක් හෝ නව ණය පහසුකමක් රුපියල්වලින් ලබා දිය හැකිය.
- සෞභාග්‍යා ණය යෝජනාක්‍රමය යටතේ ක්‍රියාත්මක "සෞභාග්‍යා කොවිඩ්-19 පුනර්ජීව ණය පහසුකම" ඔස්සේ කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ලබාදෙනු ඇත්තේ නිශ්පාදන, සේවා, කෘෂිකර්මාන්ත, ඉදිකිරීම් යන අංශ වල ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ස්වයං-රැකියා ව්‍යාපාර හා පුද්ගලයන් සහ සංචාරක, අපනයන හා මෙම ක්ෂේත්‍ර ආශ්‍රිත සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන ව්‍යාපාර සඳහා පමණි.
- එක් ගනුදෙනුකරුවෙකු (ව්‍යාපාරයක්) විසින් මූල්‍ය ආයතන කිහිපයකින් මූල්‍ය පහසුකම් ලබා ගනිමින් පැවතියද මේ යටතේ ලබා ගැනීමට සුදුසුකම් ලබන්නේ එක් ණය පහසුකමක් පමණි. මෙහිදී, පහසුකම සපයන මූල්‍ය ආයතනය විසින් අදාළ ගනුදෙනුකරුවාගෙන් මෙම යෝජනාක්‍රමය යටතේ වෙනත් මූල්‍ය ආයතනයකින් ණය පහසුකමක් ලබාගැනීමට අයදුම්කර නොමැති බවට ලිඛිත සහතිකයක් ලබා ගතයුතු වේ.
- අදාළ මූල්‍ය ආයතනය විසින් ගනුදෙනුකරුවා පවත්වාගෙන යන බැංකු ගිණුම් (විදේශ මුදල් ගිණුම් ඇතුළුව) සහ ඇප ලෙස ලබාදෙනු ලබන සුරැකුම් මත පදනම් ව එම ගනුදෙනුකරුගේ සැබෑ යෝග්‍යතාවය තක්සේරු කරනු ඇත.

- මේ යටතේ ලබා දෙනු ලබන උපරිම ණය ප්‍රමාණය අදාළ ව්‍යාපාරයේ මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය වන අතර අදාළ මූල්‍ය ආයතනය විසින් එම ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය මැනවින් සොයා බලා මාස දෙකක කාලසීමාවක් තුලදී පැන නඟින නොවැලැක්විය හැකි වියදම් (වැටුප් සහ වේතන වැනි) ගෙවීම සඳහා පමණක් ප්‍රමාණවත් වන පරිදි ණය මුදලේ ප්‍රමාණය පිළිබඳ තීරණය කල යුතුය. ව්‍යාපාරයේ මෙහෙයුම් අත්හිටුවා ඇති නම්, මාස දෙකක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව සැලකීමේදී අමුද්‍රව්‍ය පිරිවැය වැනි කාරක ප්‍රාග්ධනයේ සාමාන්‍ය සංරචක ඉවත්කල යුතුය.
- කාරක ප්‍රාග්ධනය/ආයෝජන අරමුණු සඳහා ණය ලබාදීමේදී මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුගේ පෙර තත්ත්ව වාර්තා සහ අවදානම් පැතිකඩ සලකා බලමින් සුදුසු සුරැකුමක් ඇප ලෙස ඉල්ලාසිටිය හැක.
- කාරක ප්‍රාග්ධන අරමුණු වෙනුවෙන් සුදුසුකම්ලත් සක්‍රිය සහ අක්‍රිය ණයගැතියන් සඳහා (විදේශ මුදල් ණය පහසුකම් ඇතුළත් නොවේ) මාස 02ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා ණය පහසුකම් ලබා දෙනු ඇත. එම ණය පහසුකම් වසර 2ක් තුල 4%ක වාර්ෂික පොළී අනුපාතිකයක් යටතේ ආපසු ආපසු ගෙවිය යුතුය.
- ආයෝජන අරමුණු සඳහා ණය පහසුකම ලබා දිය යුත්තේ බලපත්‍රලාභී බැංකු විසින් පමණක් වන අතර, එක් බැංකුවක් විසින් එක් ණයගැතිකුට රුපියල් මිලියන 300 නොඉක්මවන පරිදි ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ණය පහසුකම් ලබා දෙනු ලැබේ. එවැනි ණය වසර පහක් තුල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය (AWPLR) + 1.5% ක උපරිම වාර්ෂික පොළී අනුපාතයකට ආපසු ගෙවිය යුතු වේ.
- කාරක ප්‍රාග්ධන ණය සහ ආයෝජන අරමුණු ණය යන දෙවර්ගයම සඳහා 2020.03.25 සිට 2020.09.30 දක්වා කාල සීමාවක් සඳහා ණය සහන කාලයක් ලබා දෙනු ඇත.

### 39. මූල්‍ය ආයතනය මාගේ ඇමතුම්වලට පිළිතුරු නොදෙන්නේ නම් හෝ මාගේ විද්‍යුත් තැපැල් වලට ප්‍රතිචාර නොදක්වන්නේ නම් මා හට කුමක් කළ හැකිද?

- ඔබගේ මූල්‍ය ආයතනයේ නිල වෙබ් අඩවියට පිවිස පොදු සන්නිවේදන තොරතුරු ලබාගත හැක. නැතහොත්, වෙබ් අඩවිය හරහා පැමිණිලි යොමුකිරීමේ පහසුකම් සලසා ඇති නම් ඒ හරහා ඔබේ පැමිණිලි ඉදිරිපත් කල හැක.

- විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ, වට්ස්ඇප් පණිවුඩ සඳහා ප්‍රතිචාර දැක්වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන වෙත දින 45ක කාලයක් ලබා දී ඇත. එබැවින් කරුණාකර එම ආයතන වෙතින් ඔබට ප්‍රතිචාර දැක්වීම සඳහා සාධාරණ කාලයක් ලබා දෙන්න.
- බොහෝ මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන් හට ආයතනය සම්බන්ධවිය හැකි ඒ සඳහාම වෙන්වූ දුරකථක අංක රූපවාහිනී දැන්වීම් තුලින් ප්‍රචාරය කරන අතර, එවැනි අංක ඔස්සේ ඔබට අදාළ මූල්‍ය ආයතන හා සම්බන්ධ විය හැක.

**40. මා, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා වන ණය ආධාර මත 2020 අංක 2 චක්‍රලේඛය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර) ලබා දී ඇති සහන සඳහා දැනටමත් මූල්‍ය ආයතනයකට ඉල්ලීමක් කර ඒ සඳහා ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී නම් හෝ එම සහන දැනටමත් ලබාගෙන තිබේ නම් කුමක් කළ යුතුද? 2020 අංක 4 සහ 5 චක්‍රලේඛ යටතේ ලබා දී ඇති සහන ලබා ගැනීමට මා සුදුසුකම් ලබන්නේද?**

- ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ණය ආධාර පිළිබඳ 2020 අංක 02 දරණ චක්‍රලේඛය තවදුරටත් වලංගු වේ.
- පෙර යෝජනා ක්‍රමය යටතේ ලබාදී ඇති සහන සමඟ ඉදිරියට යාමට අපේක්ෂා කරන ණය ගැතියන්ට (පෙර යෝජනා ක්‍රමයේ ප්‍රාග්ධන ණය සහන කාලය නව යෝජනා ක්‍රමයට වඩා දීර්ඝ නිසා සහ එම දීර්ඝ කරන ලද සහන කාලය සඳහා අමතර පොළියක් අය නොකරන බව සලකා) ඒ සඳහා හැකියාව ඇත. (කෙසේ වෙතත්, පෙර යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය පහසුකම් සඳහා අයවන පොළී අනුපාතය නව යෝජනාක්‍රමයට වඩා වැඩිය.)
- ණය ගැනුම්කරු නව යෝජනා ක්‍රමයට මාරුවීමට කැමති නම් (පෙර යෝජනා ක්‍රමය යටතේ අනුමත කර ඇති ණය ගැතියන් ද ඇතුළුව) බැංකු විසින් ඒ සඳහා ඉඩ ලබා දෙනු ඇත.
- කෙසේ වෙතත්, පෙර යෝජනා ක්‍රමය සමඟ ඉදිරියට යාමට බැංකුව පාරිභෝගිකයාට බල නොකළ යුතුය.
- තවද කිසිදු ණය ගැනුම්කරුවෙකු හට එකවර මෙම සහන යෝජනා ක්‍රම දෙක යටතේම ණය සහනය බුක්ති විඳිය නොහැක.

**41. තම ව්‍යාපාරය ලියාපදිංචි කර නොමැති සහ කිසිදු ගිනුම් තැබීමක් කොට නොමැති සිල්ලර වෙළෙන්දෙකු හට මෙම යෝජනා ක්‍රමය ඔස්සේ සහන සලසාගත හැකිද?**

- එවැනි පුද්ගලයෙකු හට 2020.04.01 දින සිට ආරම්භ වන දින 60ක කාලසීමාව තුල අයවිය යුතු වන ණය සහ අත්තිවාරම් පියවීම සඳහා අමතර දින 60ක කාලයක් හිමිවනු ඇත.

**42. මා විසින් රුපියල් බිලියනයකට වැඩි පිරිවැටුම් ලබන කෘෂි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. මා හට මාස 6ක ණය සහන කාලය ලබා ගත හැකිද?**

- කෘෂි ව්‍යාපාර සඳහා මාස 6ක ණය සහන කාල සීමාව හිමිවන්නේ එම ව්‍යාපාරය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කාණ්ඩයට අයත් වන්නේ නම් පමණි (එනම්, වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියනය හෝ ඊට අඩු ව්‍යාපාර).
- මෙම ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියනයට වඩා වැඩි නිසා එයට මාස 6ක ණය සහන කාල සීමාව හිමි නොවනු ඇත.
- කෙසේ නමුත්, 2020.04.01 දින සිට ආරම්භ වන දින 60ක කාලසීමාව තුල අයවිය යුතු වන ණය සහ අත්තිවාරම් පියවීම සඳහා අමතර දින 60ක කාලයක් හිමිවනු ඇත.

**43. මම ස්වයං-රැකියාවක් ලෙස වාහන ආනයනයේ නිරත වෙමි. මට ණය සහන කිසිවක් ලබාගත හැකිද?**

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති 2020 අංක 04 සහ 05 දරණ චක්‍රලේඛ අනුව වාහන ආනයනකරුවන් කිසිදු ණය සහන කාලසීමාවක් සඳහා සුදුසුකම් නොලබයි.
- කෙසේ වෙතත්, ඔවුන් හට 2020.04.01 දින සිට ආරම්භ වන දින 60ක කාලසීමාව තුල අයවිය යුතු වන ණය සහ අත්තිවාරම් පියවීම සඳහා අමතර දින 60ක කාලයක පොදු සහනය ලබා ගත හැක.

**44. පුද්ගලික ණය/නිවාස ණය ලබාගෙන ඇති වතු කම්කරුවන් හට හිමිවන සහන මොනවාද?**

- ඔවුන් හට ණය මුදල රුපියල් මිලියනයට අඩු සියළු පුද්ගලික ණය සහ කල්බදු පහසුකම් ආපසු ගෙවීම සඳහා මාස තුනක ණය සහන කාලයක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.
- ණය මුදල රුපියල් මිලියනයට වැඩි නම්, ඔවුන් හට 2020.04.01 දින සිට ආරම්භ වන දින 60ක කාලසීමාව තුල අයවිය යුතු වන ණය සහ අත්තිවාරම් පියවීම සඳහා අමතර දින 60ක කාලයක පොදු සහනය ලබා ගත හැක.

-------------------- **අවසන් වරට යාවත්කාලීන කරන ලද්දේ 2020.05.06 --------------------**